රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

නිපුණතා අනාවරණ පරීක්ෂණය -2019 -3 වාරය

සිංහල

Marks

නම / අංකය : ..........................................................................................

3 ශ්‍රේණිය

- **ඡේදය කියවා පිළිතුරු ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

අහස පුරා ඒ මේ අත සරුංගල් පා වෙයි. ළමයි සරුංගලයක් සෑදීමට තීරණය කරති. සමන්, උතුළ, මනුති, ශනෙත් සහ ඉමන්දි හොඳ යහළුවෝ වෙති. සමන් ඉරටු සුද්ද කරයි. උතුළ ඒ ඉරටු එකට තබා ගැට ගසයි. මනුති සවුකොළ කපයි. ශනෙත් පාප්ප සාදාගෙන එයි. සමන් සව්කොළ අලවයි. ඉමන්දි රැලි කපා දෙයි. උතුළ සහ ශනෙත් ඒවා අලවති. සමන් සරුංගලයට නූල් දමයි. ළමයි සරුංගලය සාදා අවසන් කරති. ළමයි සරුංගලය ගෙන වෙල් ඉපනැල්ලට යති.

(01) අහස පුරා ඒ මේ අත පාවෙන්නේ මොනවා ද? ........................................

(02) ළමයි තීරණය කළේ කුමක් ද? ....................................................................

(03) ඉරටු සුද්ද කළේ කවු ද? ..............................................................................

(04) මනුති කළේ කුමක් ද? .................................................................................

(05) ළමයි සරුංගලය ගෙන ගියේ කොතනට ද? ..............................................

(06) **<u>දික් ඉස්පිල්ල</u>** සහිත වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න. .......................

(07) සමානාර්ථ පද **<u>ඡේදයෙන්</u>** සොයා ලියන්න

ගුවන.................................... මිතුරෝ ............................................

(08) විරුද්ධාර්ථ පද **<u>ඡේදයෙන්</u>** සොයා ලියන්න.

නරක................................... යට.................................................

(09) මූර්ධජ අක්ෂරයක් යෙදුණු වචනයක් **<u>ඡේදයෙන්</u>** සොයා ලියන්න.

.......................................................

(10) අප්‍රාණවාචී නාමපදයක් වචනයක් **<u>ඡේදයෙන්</u>** සොයා ලියන්න.

.......................................................



LIVEWORKSHEETS

(11) පහත වගුව සම්පූර්ණ කරන්න.

| ඒකවචන | බහුවචන |
|---|---|
| .................................. | ළමයි |
| .................................. | ඉරටු |
| සරුංගලය | .................................. |
| නූල | .................................. |

(12) ඉහත ඡේදයේ ක්‍රියා පද දෙකක් සොයා ලියන්න.

..................................................... ..................................................

(13) ප්‍රාණවාචී ඒකවචන වැකියක් **<u>ඡේදයෙන්</u>** සොයා ලියන්න.

....................................................................................................


(14) ප්‍රාණවාචී බහුවචන වැකියක් **<u>ඡේදයෙන්</u>** සොයා ලියන්න.

....................................................................................................

➢ නිවැරදි අක්ෂරය සොයා එය යටින් **<u>ඉරක් අඳින්න.</u>**

| | | | |
|---|---|---|---|
| ගා........ව | ( තා / ථා ) | මහෞ..........ධ | ( ශ / ෂ ) |
| ත.........ගය | ( යා / ඝා ) | ශීතකර ..........ය | ( ණ / න ) |
| කු.........යා | ( ඛි / ඹි ) | පෘ..........විය | ( ථි / ති ) |
| තීර..........ය | ( ණ / න ) | ප්‍රදර්...........නය | ( ෂ / ශ ) |
| ත..........කොළ | ( ණ / න ) | පා..........ණ | ( ෂා / ශ ) (1 x 10 = 10) |

➢ **පහත සංකේතවලින් කියවෙන දේ ලියන්න.**





.................................................. .....................................................



LIVEWORKSHEETS

- **විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.**

1. කවුද ආච්චි අම්මේ කෝච්චිය පදවන්නේ

   ..........................................................................................................

2. ආයුබෝවන් සභාවෙන් අවසරයි

   ..........................................................................................................

- පහත වැකිවල **<u>ඉරි ඇඳි පදය පමණක්</u>** ලිඛිත බසින් ලියන්න.

1. මම පාඩම් **<u>කරනවා.</u>** ..........................................
2. ළමයි පාසල් **<u>යනවා.</u>** ..........................................
3. සහන් මුහුණ **<u>සෝදනවා.</u>** ..........................................
4. අපි සතුටින් **<u>සිටිනවා.</u>** ..........................................
5. වලාකුළු **<u>පාවෙනවා.</u>** ..........................................

- **පහත නාම පද වර්ග කර වගුවේ ලියන්න.**

කුකුළා, පොත, ගුරුවරයා, මල, රෝහල, මහනුවර, නිමල්, කටුස්සා, පනාව, අලියා, මාමා, පාසල

| පුද්ගල නාම | සත්ත්ව නාම | ද්‍රව්‍ය නාම | ස්ථාන නාම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

- **පහත වගුව සම්පූර්ණ කරන්න.**

| පුරුෂ ලිංග පදය | ස්ත්‍රී ලිංග පදය |
|---|---|
| විදුහල්පතිතුමා | .......................................... |
| .................................. | මුව දෙන |
| .................................. | සිංහ ධේනුව |
| කුකුළා | .................................. |
| .................................. | වෛද්‍යවරිය |



LIVEWORKSHEETS

➢ **පෙළ පොතෙන් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. අශ්ව පැටියාට ගඟෙන් එගොඩට යා හැකි බව පැවසුවේ කවු ද?

   ..................................................................................

2. "පසිඳු එනකල් මම රජ වෙන්නම්" යැයි පැවසුවේ කවු ද?

   ..................................................................................

3. තමා ගෙන ආ රෝදයෙන් ඉදිකටු මුදියන්සේ සෑදුවේ කුමක් ද?

   ..................................................................................

4. ළමා සමිති රැස්වීමෙහි ලස්සන නාට්‍ය ගීතයක් ගායනා කළේ කවු ද?

   ..................................................................................

5. කොරවක් පැටික්කිට අකුරු කියවන ලද්දේ කවුරුන් විසින් ද?

   ..................................................................................

➢ **පහත වචනවල ඉරි ඇඳි පිල්ලමේ හෝ සංකේතයේ නම නිවැරදි ව සොයා යා කරන්න.**

| | |
|---|---|
| නෞකාව | කොම්බු දෙක |
| ගද්‍රා | ගැට ඇලපිලි දෙක |
| ෛදවය | යංශය |
| වෘත්තය | ගයනුකිත්ත |
| ගෲෂා | ගැට ඇලපිල්ල |

➢ **පහත තේරවිල්ලෙහි හිස් පදය පුරවා එහි පිළිතුර ලියන්න.**

ගුලක් බලා          රිංගනවා

ඒක ඇතුළෙ          කැරකෙනවා      —.—.—.—.—.—.—.—.—.—

...............................................................

තේරුවොතින් පඩි          දෙනවා



LIVEWORKSHEETS

- **පහත වැකි බහු වචනයට හරවා ලියන්න.**

1. මම පන්සල් යමි.

   ..........................................................................................

2. කුරුල්ලා පියාසර කරයි.

   ..........................................................................................

3. ගුරුවරයා අපට උගන්වයි.

   ..........................................................................................

4. සුළඟට ගස සෙලවෙයි.

   ..........................................................................................

5. ළමයා පාඩම් කරයි.

   ..........................................................................................

- **පහත අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.**

1. කිට්ටු පාරක් තිබිය දී දුර පාරකින් යාම

   ..................................................................................................................

2. සැමවිටම තමන් සමග තවත් අයගේ එකට සිටීම

   ..................................................................................................................

- **සුදුසු ක්‍රියාපදය යොදන්න.**

1. ළමයි පන්තිය පිරිසිදු ........................................
2. මම නගරයට ........................................
3. අපි කීකරු දරුවන් ........................................
4. ලේනා අඹ ........................................
5. උදේට මල් ........................................
6. ගොවියෝ කුඹුරු ........................................



LIVEWORKSHEETS

➢ **ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද වෙන් කර දක්වන්න.**

පුටුව     රියදුරා     පැන     මදුරුවා     මාලය     වඳුරා

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
| --- | --- |
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |

➢ **පහත චිත්‍රය බලා  වැකි තුනක් ලියන්න.**



1. ..........................................................................................

..........................................................................................

2 ..........................................................................................

..........................................................................................

3 ..........................................................................................

..........................................................................................



LIVEWORKSHEETS